---

කතරගම ප්‍රාදේශීය සභාව

මොණරාගල දිස්ත්‍රික්කය

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2013 සැප්තැම්බර් 10 වැනි දින දක්වා ඉදිරිපත් කර නොතිබූ අතර ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 නොවැම්බර් 16 දින ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ ගනුදෙනු වාර්තාව 2013 සැප්තැම්බර් 24 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

1.2 ගනුදෙනු, මෙහෙයුම් හා කාර්ය සාධනය පිළිබඳ අදහස් දැක්වීම

1.2.1 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.152,109 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 ආදායම් පරිපාලනය

2.1.1 වරිපනම් බදු

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 140(5) පරිදි 1997 වර්ෂයෙන් පසු වරිපනම් බදු ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය ආරම්භයේ හිඟ වර්පනම් බදු රු.4,681,827 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් මස අවසානයට එම ප්‍රමාණය රු.5,995,664 ක් විය. ඒ අනුව හිඟ වරිපනම් බදු සියයට 28 කින් වැඩි වී ඇත.

2.1.2 බදු කුලී

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 136 වගන්තිය ප්‍රකාරව කඩ කාමර කුලී තක්සේරු දෙපාර්තමේන්තුව මගින් තක්සේරු කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2001-2008 දක්වා කාලයක සිට කඩ කාමර 328 න් රු.5,524,350 ක කුලී මුදල් ගෙවීම පැහැර හැර තිබූ අතර ඒ සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159 (1) වගන්තියේ විධි විධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2.1.3 වෙළඳ බලපත්‍ර ගාස්තු

(අ) 2009 වර්ෂයෙන් පසු වෙළඳ බලපත්‍ර ගාස්තු ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වෙළඳ බලපත්‍ර ගාස්තු ලේඛනය හිඟ ආදායම් පෙන්නුම් කරන ආකාරයට පවත්වා නොතිබුණි.

2.1.4 වෙනත් ආදායම්

(අ) අතුරු ව්‍යවස්ථාවන් සම්මත කර නොගෙන ත්‍රිරෝද රථ හිමියෙකුගෙන් වර්ෂයකට රු.250 ක් බැගින් අයකර තිබුණි.

(ආ) 2010 සිට 2012 වර්ෂයන්ට අදාල රථ වාහන නැවතුම් බලපත්‍ර ගාස්තු ලදුපොත් ආපසු බාර නොදීම නිසා රු.588,000 ක් වූ හිඟ රථ වාහන නැවතුම් බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය විධි විධාන ප්‍රකාර 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යයන් සඳහා ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ ලියාපදිංචි කර ඇති හෝ එම අධිකාරිය අනුමත කර ඇති ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ තිබෙන හෝටල් / ලැගුම්හල් 06 කින් අදාල වර්ෂයට පෙර වර්ෂයේ ආදායමින් සියයට 1 නොඉක්මවන ගාස්තුවක් අතුරු ව්‍යවස්ථා පනවා අය කිරීමට කටයුතු කර නොතිබුණි.

2.1.5 ඇසල උත්සවය වෙනුවෙන් තාවකාලික වෙළඳාම සඳහා බිම් කට්ටි බදු දීම

(අ) වෙළඳ කඩ බිම් 08 ක් සඳහා ලංසු ඉදිරිපත් කර තිබූ වැඩිම ලංසුකරුගේ ටෙන්ඩරය ප්‍රතික්ෂේප කිරීම නිසා දෙවන ලංසුකරුට ටෙන්ඩරය බාර නොදී සභා තීරණ මත ටෙන්ඩර් පිරිනැමීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ රු.448,185 ක ආදායමක් අහිමි වී තිබුණි.

(ආ) දක්ෂිණ ලංකා සංවර්ධන අධිකාරියේ ඉල්ලීම මත තුරුලිය බිම් තීරුවේ අවම ලංසුව රු.15,000 ක් වූ අංක 95-98 දක්වා වෙන් කර තිබුණ කඩ බිම් ලබා ගැනීම එම ආයතනය විසින් ප්‍රතික්ෂේප කිරීම නිසා සභාවට රු.60,000 ක මූල්‍ය පාඩුවක් සිදුවී තිබුණි.

2.2 අධිභාර

--------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(3) වගන්තියේ විධිවිධාන යටතේ වගකිව යුතු අයවළුන්ට එරෙහිව මා විසින් පනවන ලද අධිභාර අනුව 2012 දෙසැම්බර් 31 දිනට අයකර ගැනීමට තිබුණු අධිභාර අගය රු.104,017 ක් විය.

2.3 නිශ්ක්‍රීය භෞතික සම්පත්

--------------------------

සමාලෝචිත වර්ෂය අවසානයට වාහන 03 ක්, ගලිසකරය හා ජල බවුසරයක් නිශ්ක්‍රීයව පැවතුණි.

2.4 අවිධිමත් ගනුදෙනු

-------------------

(අ) පළාත් පාලන කොමසාරිස්වරයාගේ 2000 නොවැම්බර් 30 දිනැති අංක 7/01/2000 දරන චක්‍රලේඛයේ විධිවිධාන පරිදි අනුමැතියක් ලබා නොගෙන වැඩ පරිපාලකවරයාට මාස 07 ක් වෙනුවෙන් රු.24,279 ක් නිවාඩු දින වැටුප් ගෙවා තිබුණි.

(ආ) 2011 වර්ෂයේ පෙබරවාරි සිට 2012 අප්‍රේල් දක්වා උසාවි දඩ මුදල් සකස් කිරීම වෙනුවෙන් නිලධාරීන් 04 දෙනෙකුට එක් අයෙකුට රු.10,000 බැගින් ගෙවා තිබුණ රු.40,000 ක් සඳහා පළාත් පාලන කොමසාරිස්වරයාගේ අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

(ඇ) සභාපතිවරයා, මන්ත්‍රීවරුන් සහ වෙනත් නිලධාරීන් උත්සව සහ වෙනත් කාර්යයන් සඳහා පළාත් පාලන කොමසාරිස් වරයාගේ අනුමැතික් ලබා නොගෙන අවස්ථා 03 කදී කුලී වාහන සඳහා රු.34,000 ක ගෙවීම් කර තිබුණි.

(ඈ) ඌව පළාත් පාලන කොමසාරිස්ගේ 2012 ජනවාරි 25 දිනැති අංක 12/ආ/061 අතිරේක ඉන්ධන ලිපිය ප්‍රකාර සභාවේ PD-1846 දරන කැබ් රථය සඳහා අනුමත ඉන්ධන සීමාව වූ ලීටර් 282 ඉක්මවා 2012 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා වූ කාලපරිච්ඡේදයේ පාවිච්චි

කර තිබුණ රු.226,915 ක් වටිනා ඉන්ධන ලීටර් 2012 ක් සඳහා පළාත් පාලන කොමසාරස්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඉ) පළාත් පාලන කොමසාරිස්වරයාගේ අනුමැතියක් ලබා නොගෙන එල්ඊ 7479 කැබ් රථයට අළුතින් එන්ජිමක් සවිකිරීම සඳහා 2011 ඔක්තෝබර් 08 දින පෞද්ගලික ගරාජයකට භාර දී තිබුණි.

(ඊ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 (ඒ) සහ (ඔ) වගන්ති ප්‍රකාරව අමාත්‍යවරයාගේ පූර්ව ලිඛිත අනුමැතියක් නොමැතිව උත්සව හා අධ්‍යාපන කටයුතු සඳහා රු.76,900 ක මුදලක් සභා අරමුදලින් වැය කර තිබුණි.

(උ) 2012 ජනවාරි මාසය සඳහා කුලී වාහනයක් යොදා ගැනීම වෙනුවෙන් ගෙවා තිබුණ රු.45,000 ක් සම්බන්ධයෙන් රාජකාරී ගමන් පිළිබඳ විස්තරයක් සහ එම කාලය තුල වාහනය යොදාගත් බව සනාථ කිරීමට කිසිදු ලිඛිත සාක්ෂියක් ඉදිරිපත් නොවුණි. මෙම ගෙවීමට අදාල රියදුරුගේ ඉල්ලීම් ලිපියක්ද නොවීය.

(ඌ) වරිපනම් බදු තක්සේරු කිරීම සඳහා පැමිණි නිලධාරීන්ට නිසි අනුමැතියක් නොමැතිව අවස්ථා 03 කදී රු.46,770 ක් ගෙවා තිබුණි.

2.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව සතු වාහන 5 කට අදාළව මාසික ධාවන සටහන් හා මාසික සාරාංශ පිළියෙල කර නොතිබුණි.

(ආ) අවස්ථා 09 කදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 වගන්තිය අනුව කටයුතු නොකර සමාලෝචිත වර්ෂයේදි රු.478,057 ක භාණ්ඩ හා සේවා මිලදී ගෙන තිබුණි.

(ඇ) අවස්ථා 17 කදී මිලදී ගන්නා ලද රු.628,311 ක් වූ භාණ්ඩ හා සේවා සඳහා මුදල් රෙගුලාසි 237 (ආ) ප්‍රකාරව තොග සහතික ඉදිරිපත් නොකෙරින.

(ඈ) රු.81,250 ක් වටිනා පරිගණකයක් සහ ඊට අදාල උපාංග මිලදී ගැනීමේ දී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.3 පරිදි කටයුතු කර නොතිබුණි.

---

(ඉ) සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් නියමිත පරිදි නොගෙවීම නිසා රු.45,913 ක දඩ මුදල් ගෙවා තිබුණි.

(ඊ) වර්ෂ ගණනාවක සිට නිලධාරීන් 12 දෙනෙකුගෙන් සභාවට අයවීමට තිබෙන සේවක ණය රු.18,400 ක් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(උ) 2001 වර්ෂයේ සිට 2012 ඔක්තෝබර් දක්වා කාලය තුල සභාව විසින් එකතු කරන ලද එකතු කළ අගය මත බදු හා භාණ්ඩ හා සේවා බදු රු.3,881,720 ක්ද, 2006-2012 දක්වා කාලයට අදාල මුද්දර බදු රු.190,700 ක්ද, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) 2011 වර්ෂයේ දී අවස්ථා 05 කදී දෙනු ලැබූ අත්තිකාරම් රු.404,000 ක් රජයේ මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව පියවා නොතිබුණි.

(එ) ලංකා බැංකුවේ අංක 0052031707 දරන ගිණුමෙන් නිකුත් කරන ලද මාස 06 ඉක්ම වූ රු.15,957 ක් වටිනා චෙක්පත් 5 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 (ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඒ) සභාව සතු වාහන 09 ක් සඳහා ලොග් සටහන් පොත් පවත්වා නොතිබූ අතර රු.312,495 ක අලුත්වැඩියාවන් හා සේවා කිරීම් මුදල් රෙගුලාසි 785(4) ප්‍රකාරව ලොග් සටහන් පොතට ඇතුලත් කර නොතිබුණි.

3. පද්ධති හා පාලන

------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අභ්‍යන්තර පාලනය

(ඇ) ආදායම් පරිපාලනය